## කැනඩාව




කැනඩාව යනු ලොව දෙවැනි විශාලතම රාජ්‍යයයි. මර්කේටර්ගේ ලෝක සිතියමේ කැනඩාව අප්‍රිකාවට වඩා විශාලත්වයෙන් යුතුවයි දක්වා ඇත්තේ.

නමුත් සත්‍ය වශයෙන්ම අප්‍රිකාව කැනඩාව මෙන් තුන් ගුණයක් විශාලය.

## රුසියාව




(රුසියන් ෆෙඩර්ෂණය නැතහොත් රුසියාව ලොව විශාලතම රාජ්‍යයයි. මර්කේටර් ලෝක සිතියමේ රුසියාව අප්‍රිකාව මෙන් දෙගුණයක් විශාලව දක්වා ඇත. නමුත් සත්‍යය නම් අප්‍රිකාව රුසියාව මෙන් දෙගුණයක් විශාල බවයි.)

## ග්‍රීන්ලන්තය




මර්කේටර් ලෝක සිතියමේ ඇති විශාලතම විකෘතිතාව නම් ග්‍රීන්ලන්තය දක්වා ඇති අන්දමයි. එයට අනුව ග්‍රීන්ලන්තය  සහ අප්‍රිකාව එක හා සමානව දක්වා ඇත.නමුත් සත්‍යය වශයෙන්ම අප්‍රිකාව ග්‍රීන්ලන්තය මෙන් 14 ගුණයක් විශාලත්වයෙන් යුක්තය යන්නය. හාස්‍යයට කරුණ නම් මෙතරම් බරපතල විශමතාවයක් තිබියදීත් ලොව දියුණුම රටවල් සියල්ලම මර්කේටර් ලෝක සිතියම ප්‍රතික්ෂේප නොකිරීමයි.

එයට හේතුව වශයෙන් ක්‍රාක් පවසන්නේ මෙවැනි අදහසකි.

"පෘථිවියේ උතුරු අර්ධ ගෝලයේ තමයි රටවල් විශාල ප්‍රමාණයක් පිහිටා තිබෙන්නේ.

ඔස්ට්‍රේලියාව, නවසීලන්තය, දකුණු අප්‍රිකාව, චිලි, ආර්ජන්ටිනාව වැනි රටවල් කීපයක් හැරුණු විට ලොව දියුණුම රටවල් සියල්ලම පාහේ පිහිටා තිබෙන්නේ උතුරු අර්ධ ගෝලයේය. එම රටවල් නියම විශාලත්වයෙන් දැක්වූවහොත් ඒවායේ නගර, මංමාවත් බොහොමයක් සිතියමේ දක්වන්නට හැකි වන්නේ නැහැ. ඒ නිසා මර්කේටර්ගේ ලෝක සිතියමේ ධ්‍රැවයන්ට සමීප රටවල් ඉතා විශාලත්වයකින් යුතුව දක්වා තිබීම වාසියක්.

බැලු බැල්මට කතාව ඇත්තය.

ඔහු එසේ පැවසුවද විචාරකයින් පවසන්නේ මෙවැනි අදහසක්.

"රුසියාව, එක්සත් ජනපදය චීනය, කැනඩාව හා එක්සත් රාජධානිය ඇතුළු සියළුම යුරෝපිය රටවල් මර්කේටර් ලෝක සිතියමේ ඉතා විශාලව පෙන්වා තිබීම ඒ රටවලට අනියමින් ලැබුණු වාසියක්. ඒ නිසාම මේ රටවල් තමන්ට තිබෙනවාට වඩා විශාල බලයක් ආරෝපණය කරගන්නවා. සැබෑ ප්‍රමාණයට වඩා ප්‍රමාණයෙන් ඉතා විශාලව තම රට අනෙකුත් ජාතීන් දකිනවාට කවුද අකමැති.

තව දුරටත් මේ මිථ්‍යාවට ඉඩ දිය යුතු නැති බව පවසමින් ජර්මන් ජාතික චිත්‍රපට නිශ්පාදකයකු සහ ජනමාධ්‍යවේදියකු වූ ආර්නල්ඩ් පීටර්ස් ලෝක සිතියමක් නිර්මාණය කරන අතර, ඔහීඝඩ ආයතනය විසින් එය ප්‍රචලිත කරන්නට උත්සුක වන්නේ එයට සාර්ථකත්වයේ සහතිකය ලබා දෙමින්.

## ආර්නල්ඩ් පීටර්ස් ලෝක සිතියම




එහි ප්‍රතිඵලයක් වශයෙන් දැන් එක්සත් රාජධානියේ සහ එක්සත් ජනපදයේ බොහෝ පාසල් වල භූගෝල විද්‍යාව ඇතුළු විශයයන් හදාරන්නට භාවිතයට ගන්නේ මෙම ආර්නල්ඩ් පීටර්ස්ගේ ලෝක සිතියමයි.

සුළු අඩුපාඩු, ඇතත් සමතල සිතියම් ප්‍රක්ෂපේණයක් ලෙස සාර්ථක ආර්නල්ඩ් පීටර්ස්ගේ ලෝක සිතියම වෙතින් ලෝකය දකින්නට අපේ දරුවන්ට හැකිවේවායි පතමු.



